# ශ්‍රී ලංකාවේ සීඝ්‍ර ආර්ථික සංවර්ධනයට නායකත්වය දීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට

# ඔබව අවශ්‍යයි..




## නේවාසික ව්‍යාපාර කළමනාකාර - මහවැලි අධිකාරිය

සේවා ශ්‍රේණිය :- ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-1 සේවා ශ්‍රේණිය)

වැටුප් පරිමාණය :- රු. 81,670 - 15 x 2,270 = 115,720/=

**සුදුසුකම්ලත් අයදුම්කරුවන් පහත සුදුසුකම් (පහත 1 හෝ 2) සපුරා තිබිය යුතුය.**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සමග

කළමනාකරණ/කෘෂිකර්ම/සැලසුම්/සංවර්ධන/සමාජීය විද්‍යා/තාක්ෂණ/ජල කළමනාකරණ විෂයය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම/ තනතුරට අදාල විෂයය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර" මට්ටමේ තනතුරක අවම වශයෙන් පරිපාලන/වාරිමාර්ග/ ජල කළමනාකරණ/කෘෂිකර්ම/ඉඩම්/සංවර්ධන හා ආයතන සංවර්ධන ක්ෂේත්‍රයේ වසර (15)ක පළපුරුද්දක් තිබීම.

2. තනතුරට අදාල විෂයය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර" මට්ටමේ තනතුරක අවම වශයෙන් පරිපාලන/වාරිමාර්ග/ ජල කළමනාකරණ/කෘෂිකර්ම/ඉඩම්/සංවර්ධන හා ආයතන සංවර්ධන ක්ෂේත්‍රයේ වසර (15)ක පළපුරුද්දක් තිබීම.

වයස - අවු. 35ට නොඅඩු හා අවු. 55ට නොවැඩි විය යුතුය. ( මහවැලි අධිකාරියේ සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙය අදාල නොවේ.)

බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

---

**සටහන් :** දැනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවයේ නිරත ඉහත සුදුසුකම් සපුරා ඇත්නම් ඔබේ අංශ ප්‍රධානියාගේ අනුමැතිය ඇතිව අයදුම්පත යොමු කල හැක.

තමා විසින් සකස් කරගත් ජීවදත්ත පත්‍රිකාවක් 2021.10.17 වන දිනට හෝ එදිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී.බී.ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ gdndesilva@yahoo.com විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතුව ඇත.

අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු අතර, නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදු වන බවද දන්වමි. අයදුම්පත සමඟ අධ්‍යාපන/වෘත්තීය සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, එම සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම කටයුතු සම්බන්ධව අවසන් තීරණය ගැනීම අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු බවද දන්වමි.

සැ.යු. - අයදුම්පත් බාර ගන්නා අවසන් වන දිනය වන විට තනතුරට අදාල සුදුසුකම් සපුරා තිබිය යුතු බව කාරුණිකව සලකන්න.

අධ්‍යක්ෂ ජනරාල්.
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

---

වාරිමාර්ග අමාත්‍යාංශය
நீர்ப்பாசன அமைச்சு
Ministry of Irrigation

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
இலங்கை மகாவலி அதிகார சபை
MAHAWELI AUTHORITY OF SRI LANKA.

මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය